සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

(63)

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | MF/WBB/02/Notice/D/Dvi.s/202 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date 2023.08. 14 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම් වරුන්
අභියාචනා මණ්ඩල සභාපතිවරුන් හා සාමාජිකයින් වෙත

<u>අභියාචනා මණ්ඩල විසින් අභියාචනා හා විරෝධතා පරික්ෂා කිරීමේ ක්‍රියාවලිය</u>

අස්වැසුම ප්‍රතිලාභීන් තේරීම් සිදු කිරීමෙන් පසුව ඉදිරිපත්ව ඇති අභියාචනා හා විරෝධතා සම්බන්ධයෙන් ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳව නිකුත් කර ඇති සමාංක 2023.06 23,2023.06.27,2023.07.18(පළවනි ලිපිය) ,(දෙවැනි ලිපිය)හා 2023.07.23 දිනැති උපදෙස් ලිපිවලට අමතර වශයෙනි.

**02.** මාගේ ඉහත සඳහන් 2023.07.18 දිනැති අභියාචනා පරික්ෂා කිරීමේ ක්‍රියාවලිය මැයෙන් නිකුත් කරන ලද උපදෙස් ලිපියට අමතර වශයෙන් අභියාචනා මණ්ඩල විසින් අභියාචනා පරික්ෂා කිරීමේදී අනුගමනය කළයුතු කරුණු සම්බන්ධයෙන් වැඩිදුරටත් මාර්ගෝපදේශ නිකුත් කිරීමත් විරෝධතා පරිකෂා කිරීමට අදාළව වැඩිදුරටත් මාර්ගෝපදේශ නිකුත් කිරීමත් මෙහි අරමුණ වේ. මෙම උපදෙස් අනුගමනය කරමින් අභියාචනා වලට ප්‍රථමයෙන් විරෝධතා සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා ඉක්මනින් අවසන් කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස ද දන්වා සිටිමි.

03. තේරීම් ක්‍රියාවලියේදී ලකුණු ලබා දීමේ ක්‍රියාවලියට ඇතුළත් නොවී තිබූ අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම :-

3.1 තේරීම් කමිටුව විසින් අනුමත කර නොතිබූ අයදුම්පත්

3.2 තේරීම් කමිටුව අනුමත කර තිබුනද ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර නොතිබූ අයදුම්පත්

ඉහත 3.1 හා 3.2 අවස්ථාවන් සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත්ව තිබුණද, නොතිබුණද වැඩ අවසන් කර තේරීම් ක්‍රියාවලියට ඇතුළත් කර යුතුව තිබේ. මේවා අභියාචනා කමිටුවෙන් ක්‍රියා කළයුතු බවට කලින් තීරණය කර තිබුණේ වවුද පරිගණක පද්ධතිය තුළින් සුමට ලෙස හා විධිමත් ලෙස සහ පූර්ව හා පසු සබඳතා තහවුරු වන පරිදී ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත එම අයදුම්පත් සම්බනධයෙන් දැනට පත් කර ඇති තේරීම් කමිටුව මගින් හා අදාළ ප්‍රාදේශීය ලේකම් මගින් එම අනුමත කිරීම් සිදුකර අභියාචනා මණ්ඩලයට යොමුකළ යුතුවේ.

3.3 විවිධ හේතුන් නිසා සංගණනයට භාජනය නොවූ අයදුම්පත්

මෙම අයදුම්පත් සම්බනධයෙන් සුදුසු සංගණන නිලධාරියෙකු යොදවා සංගණනය කරවීමට අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් ක්‍රියාකළ යුතු වේ. ඉන්පසු තේරීම් කමිටුවට යොමු කර අනුමැතිය ලබා ගැනීමත් ප්‍රාදේශීය ලේකම් අනුමත කිරීමත් සිදුකළ යුතුයි. ඉන්පසු අභියාචනා මණ්ඩල වලට යොමු කළ යුතුවේ.

3.4. ප්‍රාදේශීය ලේකම්වරුන් හෝ තේරීම් කමිටුව විසින් නැවත සංගණනයට යොමුකළ අයදුම්පත්

මෙම අයදුම්පත් සඳහා පෙර සංගණනයට සම්බන්ධ නොවූ සංගණන නිලධාරියෙකු යොදවා සංගණනයට ලක්කර ඉන්පසුව තේරීම් කමිටුව හා ප්‍රාදේශීය ලේකම් අනුමත කිරීමෙන් පසුව අභියාචනා මණ්ඩලයට යොමුකළ යුතුවේ.

ඉහත සඳහන් 3.1 සිට 3.4 දක්වා අවස්ථාවන් වලදී අභියාචනා මණ්ඩලය තීරණය ලබාදීමෙන් පසුව ලකුණු ලබා දීමේ සූත්‍රය අනුව තේරීම් සිදු කිරීමට අදාළ කරගනු ලැබේ.

**04. පරිගණක පද්ධතිය තුළින් දත්ත පරික්ෂා කර තීරණ ගැනීම :-**

4.1 යම් අභියාචනයක් මගින් ඉදිරිපත් කරන ලද කරුණු පිළිගන්නේ යැයි උපකල්පනය කළහොත් ඒ අනුව දත්ත සංශෝධනය කළද පවත්නා තත්වයේ වෙනසක් නොවන අභියාචනා සියල්ල එකවර ප්‍රතික්ෂේප කරන ලෙස මීට පෙර උපදෙස් දී තිබුනි. එහෙත් ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ අදහස් සැලකිල්ලට ගෙන එම පහසුකම පරිගණක පද්ධතියෙන් ඉවත් කර ඇති අතර අභියාචනා එකින් එක සැලකිල්ලට ගෙන අභියාචනා මණ්ඩලය විසින් දත්ත සංශෝධනය කිරීම සිදුකළයුතු වේ. ඒ අනුව සුදුසුකම් වෙනස් වන්නේ ද නැද්ද යන්න පරිගණක පද්ධතිය මගින් ලකුණු ලබාදීමේ සූත්‍රය අනුව සිදුවනු ඇත.

4.2. **පවුලේ සාමාජිකයින් (ජන විකාශනය) පිළිබඳ තොරතුරු වලට අදාළ අභියාචනා සහ විරෝධතා :-**

අභියාචනා සහ විරෝධතා පරික්ෂා කිරීමේදී පවුලක සාමාජිකයින් පිළිබඳ කරුණු තහවුරු කර ගැනීම සඳහා ඡන්ද දායක ලැයිස්තුවල දත්ත පරිශීලනය කිරීමට පහසුකම් සලසා ඇත. එහෙත් මෙමගින් තහවුරු කරගත හැක්කේ ඡන්දය සඳහා ලියාපදිංචි වී සිටින වැඩිහිටි පුද්ගලයින්ගේ දත්ත පමණක් බව සැලකිය යුතුය. පරිගණක පද්ධතියේ ඇතුළත් මෙම දත්ත බලා ගැනීමට පහසුකම් සලසා ඇත. සාමාජිකයින් ගණන සංශොධනය කළයුතු බව නිරීක්ෂණය වන්නේ නම් නැවත සංගණනයකට යොමු කිරීම තුළින් අදාළ පියවර අනුගමනය කිරීමෙන් එය සිදුකළ හැක .

සාමාජිකයින් ප්‍රමාණය සංශෝධනය වීම තුළින් පවුලේ සාමාජික සංඛ්‍යාව 2කට වැඩි වන්නේ නම් මුළු ප්‍රතිලාභ මුදලට හිමිකම් ලබන අතර 2ක හෝ ඊට අඩු වන්නේ නම් ප්‍රතිලාභයෙන් අඩක් හිමිවේ.

4.3 ලංකා විදුලි බල මණ්ඩලයේ හා ලී.ස.ලෙකෝ සමාගමෙන් විදුලි පරිභෝජනයට අදාලව 2023 ජනවාරි,පෙබරවාරි හා මාර්තු මාසවල පරිභෝජනය කළ ඒකක ප්‍රමාණයෙන් මාසික සාමාන්‍ය අගය දත්ත ලෙස ඇතුළත් කර ඇත. ඒ අනුව අභියාචනය හෝ විරෝධතාවය මගින් ඉදිරිපත් කරන දත්ත. සංගණනයේදී ඇතුළත් කර තිබූ දත්ත හා ඉහත කී දත්ත සංසන්දනය කර නිවැරදි තීරණය ගෙන දත්ත සංශෝධනය කිරීමට අභියාචනා මණ්ඩලයට හැකියාව ඇත. මෙහිදී විදුලිබල මණ්ඩලයෙන් හා ලෙකෝ සමාගමෙන් ලබා ගත් දත්ත නිල වශයෙන් පිළිගත හැකි ඒවා සේ සැළකීම සුදුසු වේ.

අයදුම් කිරීමේදී විදුලි පරිභෝජනයට අදාළ ගිණුම් අංකය සඳහන්වී නොතිබුණ අයදුම්පත්වලට අදාළව විදුලි බල මණ්ඩලයෙන් හෝ ලෙකෝ සමාගමේ දත්ත ලබා ගෙන නැති බවද සැලකිය යුතුය. දත්ත සංශෝධනය කිරීම තුළින් ඇතිවන ප්‍රතිඵලය විදුලි ඒකක ප්‍රමාණය 60 හෝ ඊට වැඩි නම් ඊට අදාළ ලකුණු 0 වන අතර 60ට අඩු නම් එම ලකුණු 1ක් වනු ඇත.

4.4. වාහන අයිතිය දැරීම සම්බන්ධ දත්ත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට දැනට ක්‍රියාකරමින් පවතී. පද්ධති අනුකූලතා ගැටළු විසඳා ගැනීමෙන් පසු එම දත්ත ලැබීමෙන් පසුව පවත්නා දත්ත, අභියාචනා හා විරෝධතා වල දත්ත සමග පරික්ෂා කර නිවැරදි තාවය තහවුරු කර ගැනීම සඳහා ඒවා ඇතුළත් කිරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ.

**05. විරෝධතා සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම :-**

පුරවැසියන් විසින් සෘජුව ඇතුළත් කරන ලද විරෝධතා මෙන්ම පුරවැසියන් විසින් නාමිකව හෝ නිර්නාමිකව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ලිඛිතව බාර දෙන ලදුව අදාළ කාර්යාලවල නිලධාරීන් විසින් පරිගණක ගත කරන ලද විරෝධතා පරීක්ෂණයට භාජනය කළ යුතුවේ. ඉදිරිපත් කර ඇති සියළු විරෝධතා පරිගණක පද්ධතිය තුළින් අභියාචනා මණ්ඩල වලට දැකබලාගත හැක.

5.1 ඉදිරිපත්ව ඇති විරෝධතා සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා අභියාචනා මණ්ඩල විසින් ඉදිරිපත්ව ඇති එක් එක් තොරතුරුවල ස්වභාවය අනුව සුදුසු ක්‍රමවේදයක් මගින් එහි සත්‍ය තත්වය අනාවරණය කර ගත යුතුයි. මේ අනුව පවුලේ සාමාජිකයින් සම්බන්ධයෙන් පරිගණක පද්ධතියට ඇතුළත් කර ඇති ඡන්ද දායක ලැයිස්තුව සමග පරීක්ෂා කිරීමෙන් ග්‍රාම නිලධාරී මගින් තොරතුරු ලබා ගැනීමත් කළහැක. මෙහිදී පසුව මියගිය සාමාජිකයින් පිළිබඳවත් අවධානය යොමුකළ යුතුයි. විදුලි පරිභෝජනය සම්බන්ධයෙන් ද පරිගණක පද්ධතියේ ඇතුළත් කර ඇති විදුලිබල මණ්ඩලයේ හා ලෙකෝ සමාගමේ

දත්ත සමග සැසඳීමක් කළ හැක. මේ අනුව දත්ත සංශෝධනය කිරීම හෝ ස්ථිර කිරීම අභියාචනා මණ්ඩල විසින් සිදුකළ යුතුවේ.

5.2. පවුලේ ආදායම හා වියදම වැනි කරුණු සනාථ කිරීම ග්‍රාම නිලධාරින්ගේ ආදායම් සහතිකයක් මගින් තහවුරු කර ගැනීමට හැකියාව ඇත. එසේ නිවැරදි දත්ත තහවුරු කරගෙන ඒ අනුව දත්ත සංශෝධනය කිරීම හෝ ස්ථිර කිරීම සිදුකළ හැකිය.

5.3. නිවාස වල තත්වය,ආලෝක පහසුකම්,සනීපාරක්ෂක හා ජල පහසුකම්,වාහන යන්ත්‍රෝපකරණ,ඉඩම් ආදී කරුණු තහවුරු කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරි හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යලයේ සිටින සංවර්ධන නිලධාරින්, ග්‍රාම සංවර්ධන නිලධාරින්, සමාජ සේවා නිලධාරින්, ජනපද නිලධාරින් වැනි වෙනත් ක්ෂේත්‍ර නිලධාරින් ද යොදවා ගැනීමට හැකියාව ඇත. ඒ සඳහා අභියාචනා මණ්ඩල විසින් අදාළ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ගේ සහාය ලබාගත හැකියි. එසේ ලබා ගන්නා දත්ත පිළිබඳ සුදුසු තීරණ ගැනීමෙන් පසුව අභියාචනා මණ්ඩල විසින් එම දත්ත සංශෝධනය කිරීම හෝ ස්ථිර කිරීම කළ යුතුයි. ඒ අනුව අදාළ නිර්ණායකයට නියමිත ලකුණු වෙනස්වීම හෝ වෙනස් නොවීම සිදුවිය හැකියි.

**06. ප්‍රතිලාභී ලැයිස්තුවෙන් ඉවත් කිරීමට නිර්දේශ කිරීම :-**

2002 අංක 24 දරණ සුබසාධක පනතේ 7 වැනි වගන්තිය අනුව අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු යම් කිසිවක් අසත්‍ය බවට තහවුරු වන්නේ නම් එම එම තැනැත්තා තේරීම් ලැයිස්තුවේ යම් කාණ්ඩයක් යටතේ සුදුසුකම් ලබා සිටී නම් එම පනතේ 14 වගන්තිය යටතේ ක්‍රියාකරමින් එම තැනැත්තාගේ නම ඉන් ඉවත් කිරීම සඳහා නිර්දේශ කිරීමට අභියාචනා කමිටු වල සභාපතිවරුන් වශයෙන් ක්‍රියා කරන ප්‍රාදේශීය ලේකම් වරුන්ට බලය පවරනු ලැබේ. එම තීරණ සුබසාධක මණ්ඩලය වෙත යොමු කිරීමෙන් පසුව මණ්ඩලය විසින් අනුමත කළ යුතුවේ. මෙම පනත යටතේ ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලය පවරා ඇති හෙයින් 14වැනි වගන්තිය යටතේ යම් නිර්දේශයක් අභියාචනා කමිටුවට ඉදිරිපත් කිරීමට අදාළ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ට ද හැකියාව ඇත. ඒ සඳහා පරිගණක පද්ධතිය තුළ පහසුකම් සලසා ඇත. මෙවැනි තීරණයක් ගැනීමේ දී අදාළ අයදුම්කරුවන් තමන් විසින් වංචා සහගත ලෙස සුදුසුකම් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිතා මතාම අසත්‍ය තොරතුරු සඳහන් කිරීම හෝ සත්‍ය තොරතුරු වසන් කිරීම සිදුකර ඇති බවට අභියාචනා කමිටුව විසින් තහවුරු කරගත යුතුවේ. නව තීරණයට හේතුවූ කරුණු පද්ධතියට ඇතුළත් කළයුතු වේ.

**07. සුදුසුකම් ලැබූ පුද්ගලයින් විසින් ස්වෙච්ඡාවෙන් ප්‍රතිලාභ ප්‍රතික්ෂේප කිරීම :-**

සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් විසින් ස්වෙච්ඡාවෙන් තම ප්‍රතිලාභය ලැබීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවන් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මා වෙත වාර්තා කර ඇත. එවැනි ඉල්ලීම් අයදුම්කරු වෙතින් දිවුරුම් ප්‍රකාශයක් මගින් හෝ ග්‍රාම නිලධාරි හෝ අදාළ ප්‍රාදේශීය ලේකම් ඉදිරියේ කරනු ලබන ලිඛිත ප්‍රකාශයක් වශයෙන් හෝ ලබා ගෙන අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අවශ්‍ය පියවර ගැනීම සඳහා මා වෙත එවිය යුතු වේ.

**08. පරිගණක පද්ධතිය තුළින් ක්‍රියා කිරීම සඳහා මාර්ගෝපදේශ :-**

අභියාචනා පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියට අදාළව පරිගණක පද්ධතිය තුළින් ක්‍රියා කරන ආකාරය සම්බන්ධයෙන් ලබා දෙන ලද මාර්ගගත ලෙස පුහුණු වීම් වළට අනුකූලව මාර්ගෝපදේශ මීට පෙර එවා ඇත. විරෝධතා පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රියාවලිය ද ඇතුළත්ව පරිගණක පද්ධතිය තුළින් ක්‍රියා කරන ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ මේ සමග අමුණා එවමි.

**09.** මෙම උපදෙස් මාලාව අභියාචනා කමිටු වලට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේ දී අදාළ අයදුම්කරුවන්ගේ දත්ත හා තොරතුරු පරීක්ෂා කර සත්‍ය අසත්‍යතාවය අනාවරණය කර ගැනීම සඳහා මග පෙන්වීම ඉවහල් වන මාර්ගෝපදේශ ලෙස සැලකිය යුතු අතර ඊට අතිරේකව වෙනත් සුදුසු ක්‍රමවේද අනුගමනය කරමින් කමිටු සාමාජිකයින්ගේ පළපුරුද්ද හා දැනුම යොදා ගනිමින් මෙම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇතැයි අපේක්ෂා කරමි.

**10. සුදුස්සන් තේරීමේ නිර්ණායක පිළිබඳව දැනුවත් වීම:-**

පරිගණක පද්ධතියට ඇතුළත් කරනු ලබන දත්ත අනුව සලකා බලනු ලබන නිර්ණායක යටතේ ලකුණු ලබා දෙන ක්‍රමවේදය පිළිබඳව ඔබට දැනුවත් වීම සඳහා අවශ්‍ය නම් 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ 2022.10.20 දිනැතිව අංක 2302/23 දරණ ගැසට් නිවේදනය මගින් පලකරන ලද නියෝග පරිශීලනය කළ හැකි බවද දන්වමි. ඒ පිළිබඳ වැඩිදුර පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වූ විට සහාය වීමට මා ඇතුළු සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ නිලධාරීන් සූදානමින් සිටින බවද දන්වා සිටිමි.

**11. නිරීක්ෂණ මට්ටමින් හා වෙනත් ආකාරයෙන් නිලධාරීන්ගේ සහාය ලබා ගැනීම :-**

අභියාචනා මණ්ඩල මගින් පරීක්ෂණ කටයුතු සිදු කිරීමේදී අවශ්‍යතාවය පරිදි ග්‍රාම නිලධාරී සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරී වැනි සුදුසු නිලධාරීන් නිරීක්ෂණ මට්ටමින් සහභාගී කරවා ගැනීමට අභියාචනා මණ්ඩල සභාපතිවරුන්ට බලය ඇත. විශේෂයෙන්ම අවශ්‍ය තොරතුරු සනාථ කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරී සම්බන්ධ කර ගැනීම වැදගත් වේ. ඒ සඳහා ග්‍රාම නිලධාරීන් වෙත මෙම විෂය යටතේ බලතල පැවරීමක් ද සිදුකර ඇත. තවද අදාළ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් මගින් එම කාර්යාලයේ මෙම විෂයට අදාළ නිලධාරීන් කමිටුවේ සහායට යොදා ගත හැකි බව ද දන්වමි.

මෙම චක්‍රලේඛයට පෙර මෙම කරුණට අදාළව නිකුත් කරන ලද උපදෙස් මේ මගින් සංශෝධන වී ඇති බව කාරුණිකව සලකන්න.

**බී.විජයරත්න**

**සභාපති/කොමසාරිස්**

පිටපත් - 1. ලේකම්, මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

2. ලේකම්, රාජ්‍ය පරිපා,ස්වදේශ කටයුතු,පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය

} දැ.ගැ.පි